**ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) මෙම වාර්තාවේ 1.6.1.1. (අ) (i), (ii) හා (iv) ඡේදයන් හි දැක්වෙන නිරීක්ෂණ පිළිබඳව ඉකුත් වර්ෂයේ දී මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශයන් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### (අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | එකතු කිරීමේ අගය මත බදු ආදායම, ආදායම් සංකේත අනුව හඳුනා ගැනීමෙන් තොරව එකතු කිරීමේ අගය මත බදු අනෙකුත් සේවා ආදායම් සංකේතයට මාරු පත්‍රයක් මඟින් රු.896,632,803ක හර කර තිබුණි. ඒ අනුව මූල්‍ය සේවා, අනෙකුත් සේවා හා නිෂ්පාදන යන ආදායම් සංකේත තුනෙහිම ශුද්ධ ආදායමේ නිරවද්‍යතාව තහවුරු නොවිය. | ආදායම් වර්ගීකරණය කිරීමේ අපහසුතාව මත මාරු පත්‍රයක් මඟින් ගිණුම්ගත කළ බව. | නිවැරදි ආදායම් සංකේතයට බැර කළ යුතු බව. |
| (ii) | සාමුහික නොවන ආදායම් බදු යටතේ වන අංක 10.04.02.99 දරන අනෙකුත් ආදායම් සංකේතයට සමාලෝචිත වර්ෂය තුල දී භාණ්ඩාගාර සටහන් හි රු.276,892,665,273ක් බැර වී තිබුණ ද දෙපාර්තමේන්තු ආදායම් වර්ගීකරණයේදී මෙම ආදායම රු.277,898,472,965ක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් රු.1,005,807,692ක නොසැසඳීමක් ද විය. මෙම නොසැසඳීම දෙපාර්තමේන්තු පොත් වල අනෙකුත් ආදායම් සංකේතයට ගලපා භාණ්ඩාගාර පොත් සමඟ සමාන කර තිබුණි. | -එම- | භාණ්ඩාගාර තොරතුරු හා දෙපාර්තමේන්තු පොත් අතර පවතින වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන ගැලපීම් සිදු කළ යුතු බව. |
| (iii) | භාණ්ඩාගාරයේ සටහන් හා දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම් පිළියෙළ කිරීමේදී පැන නඟින වෙනස්කම් වලට හේතු හඳුනා ගැනීමෙන් තොරව රු.4,130,127ක් අනෙකුත් ආදායම් සංකේතයට ගලපා භාණ්ඩාගාර පොත් සමඟ සමාන කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| **(iv)** | ආදායම් රැස්කිරීමේ බැංකු ගිණුම් මගින් භාණ්ඩාගාරයට බැර වන මුදල්, බැංකු ගිණුම් ප්‍රකාශ සමඟ සසඳා හඳුනා ගෙන ඇති වෙනස්කම් කාලීනව නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබීම හේතුවෙන් ගිණුම්කරණ පාලන පද්ධතියේ දුර්වලතා පැවතීම. | හඳුනා ගන්නා අඩුපාඩු නිවැරදි කිරීමට ප්‍රමාණවත් කාලයක් ගත වන බව. | ආදායම් සැසඳීම් වාර්තා හඳුනා ගෙන, කාලීනව පිළියෙල කර හඳුනා ගන්නා අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගැනීම හා ඒ පිළිබඳ පසු විපරම් සිදු කිරීම. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට භාණ්ඩාගාරයේ තොරතුරු අනුව ස්ථාවර වත්කම් ශේෂය රු. 5,696,214,443ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එකී ශේෂය රු.5,635,976,225ක් වූයෙන් රු.60,238,218ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස සම්පූර්ණයෙන් තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. | භාණ්ඩ සමීක්ෂණයෙන් හා වත්කම් ප්‍රත්‍යාගණනයෙන් සිදු වූ ගැලපීම් නිසා වෙනස සිදු වූ බව. | මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අයිතමයන්ට සිදුකළ ගැලපීම් සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කල යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල රු.15,068,071ක් වටිනා ස්ථාවර වත්කම් විකිණීමෙන් අපහරණය කර තිබුණු බව හෙළිදරව් කර තිබුණද එය වැරදි නිවැරදි කිරීමට සිදුකල සටහනක් ලෙස විගණනය වෙත වාර්තා කල ද එය සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවීය. | මෙම අගය වත්කම් විකිණීම නිසා සිදුව නොමැති බවත් සිගාස් වැඩසටහනේ කරන ලද වැරදි නිවැරදි කිරීම නිසා සිදුව ඇති බව. | මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අයිතමයන්ට සිදුකළ ගැලපීම් සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ. 6 ආකෘතියෙහි මූලධන වත්කම් අත්පත්කර ගැනීම රු.289,913,588ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.2,691,178ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 පළමු හා දෙවන ගිණුම් සාරාංශ මගින් මෙම ස්ථාවර වත්කම්වලට අදාළව ගිණුම්ගත කිරීම් සිදුකල බව. | සමාලෝචිත වර්ෂය පිළිබඳව නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතු බව. |

**1.6.3 හිඟ බදු ආදායම**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------ | ------------------------------ | ------------- |
| (අ) හිඟ බදු වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට දළ හිඟ බදු හා දඩ මුදලේ එකතුව රු. බිලියන 697.6 ක් වුවද එම මුදලින් අයකර ගත හැකි හිඟ බදු හා දඩ ලෙස හඳුනාගෙන ඇති රු. බිලියන 267.4 ක් පමණක් සමාලෝචිත වර්ෂයට අදාළව හා වර්ෂය අවසාන දිනට හිඟ බදු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. අයකිරීම් තාවකාලිකව අත්හිටුවා ඇති රු. බිලියන 430.2ක හිඟ බදු මූල්‍ය ප්‍රකාශන වල ඒ.සී.ඒ – 1(i) ආකෘතියේ හෙළිදරව් කර නොතිබුණි. | ඒ.සී.ඒ-1(i) ආකෘතියට අදාළව පිළියෙළ කිරීමට කටයුතු කරන බව. | අය කිරීම් තාවකාලිකව අත්හිටුවා ඇති හිඟ බදු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු බව හා හිඟ ආදායම ආදායම් සංකේත අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බව. |
| (ආ) එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැඟීමේ බදු වල හිඟ ශේෂයන් ආදායම් සංකේත අනුව වර්ගීකරණය නොකොට දක්වා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | අදාළ අංශ වෙත දැනුවත් කල බව. | හිඟ ආදායම, ආදායම් සංකේත අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බව. |
| (ඇ) හිඟ ආදායම් වාර්තා අනුව, සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ බදු, අයකළ හැකි හා අය කිරීම් තාවකාලිකව අත්හිටවූ හිඟ බදු හා දඩ මුදල් පිළිවෙළින් රු.බිලියන 264.4ක් සහ රු.බිලියන 314.8ක් වශයෙන් එකතුව රු.බිලියන 579.2ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන වල ඒ.සී.ඒ – 1(i) ආකෘතියේ මෙම ආරම්භක ශේෂ දක්වා නොතිබුණි. | පිළියෙළ කිරීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂ නිවැරදිව දැක්විය යුතු බව. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශන වල ඒ.සී.ඒ – 1(i) ආකෘතියේ අය කර ගත හැකි හා තාවකාලිකව අත්හිටවූ හිඟ බදු හා දඩ මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ බදු අය කර ගැනීම් දක්වා නොතිබුණ ද නියැඳි විගණන පරීක්ෂාවේ දී රු.බිලියන 2.3ක් අය කර තිබුණු බව අනාවරණය විය. | පිළියෙළ කිරීමට කටයුතු කරනු ලබන බව. | හිඟ බදු ආදායම් රැස් කිරීමට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු බව. |

**1.6.4 අවිනිශ්චිත ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 මාර්තු 29 දිනට RAMIS පද්ධතිය තුල රු.මිලියන 1,385 ක නිරවුල් නොවූ අවිනිශ්චිත ශේෂයක් පැවතිම හේතුවෙන් හිඟ බදු ශේෂය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | අවිනිශ්චිත ගිණුමට අදාළ ශේෂ නිවැරදිව හඳුනා ගෙන සුදුසු ගැලපීම් කර නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනයෙහි වාහන හානි සම්බන්ධයෙන් වූ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ප්‍රසම්පාදන හා වත්කම් කළමණාකරන අංශය මගින් පවත්වාගෙන යනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි ලේඛනය යාවත්කාලීන කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු කිරීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව රු. බිලියන 723.7ක් වූ අතර සංශෝධිත ඇස්තමේන්තු වටිනාකම රු. බිලියන 575.4ක් ද සත්‍ය ආදායම් රැස් කිරීම රු. බිලියන 511.1ක් ද විය. සංශෝධිත ඇස්තමේන්තු හා සත්‍ය ආදායමෙහි රු. බිලියන 64.3ක විචලතාවයක් පැවැති අතර එය සියයට 11 ක් විය. එක් එක් ආදායම් විස්තර අනුව ද සංශෝධිත ඇස්තමේන්තු සමඟ සත්‍ය ආදායම සියයට 6 සිට සියයට 193 දක්වා වූ පරාසයකින් | රට තුළ පැවති කොවිඩ් – 19 වසංගත තත්ත්වය හා බදු ප්‍රතිපත්ති වල සැලකිය යුතු වෙනස්කම් මේ සඳහා හේතු වූ බව. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | වෙනස් වී ඇති හෙයින් ආදායම් ඇස්තමේන්තු කිරීම විධිමත් පරිදි සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ආදායම් සංකේත 06ක් සඳහා ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ආදායම් සංකේත 06 යටතේ රු. මිලියන 2,731.5ක් රැස් කර තිබුණි. | හිඟ බදු හා දඩ මුදල් රැස් වීම පමණක් සිදු වන බව. | -එම- |

2.1.2 **ආදායම් රැස් කිරීම**

---------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------ | --------------------------- | ------------ |
| (අ) | ආදායම් සංකේතාංක 10.03.11.00 දරන ප්‍රේෂණ ගාස්තු ආදායම් ශීර්ෂ සඳහා සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාළව පිළිවෙළින් රු. මිලියන 1 ක් සහ රු. මිලියන 3ක් ඇස්මේන්තු කර ඇතත් කිසිදු ආදායමක් රැස්කර නොතිබුණි. | අදාළ වර්ෂය හා පූර්වෝක්ත වර්ෂයේ දී එවැනි ආදායමක් ගිණුම්වලට ලැබී නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ආදායම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 1 අනුව ආදායම් බදු රැස්කිරීමේ ශුද්ධ අගය රු.268,249,209,463ක් වන අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූප ආදායම් බදු රැස්කිරීමේ ශුද්ධ අගය රු.427,699,517,596ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශුද්ධ ආදායම් බදු රැස්කිරීම රු.159,450,308,133කින් එනම් සියයට 37.28කින් පහළ ගොස් තිබුණු බව නිරීක්ෂණය විය. | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ සිදුකරන වෙනස්කම් මේ සඳහා හේතු වී ඇති බව. | රැස්කළ බදු ආදායම පෙර වර්ෂවල හිඟ රැස් කිරීම, සමාලෝචිත වර්ෂයේ ස්වතක්සේරු මත හා අතිරේක තක්සේරු මත රැස් කිරීම් ලෙස වෙන් කර වාර්තා ලබා දීමේ ක්‍රමයක් සකස් කර ගත යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල එකතු කළ අගය මත බදු ආදායම හා ජාතිය ගොඩනැඟිමේ බදු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් රු.210,091,011,430කින් හා රු.68,321,252,447කින් අඩු වී තිබුණි. | එකතු කළ අගය මත බදු 15% සිට 8% දක්වා අඩු වීම හා ජාතිය ගොඩනැඟිමේ බදු ඉවත් වීම මේ සඳහා හේතු වී ඇති බව. | -එම- |

2.1.3 **හිඟ බදු ආදායම්**

(අ) 2020 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ආදායම් වාර්තා සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(i)** හිඟ ආදායම් වාර්තා අනුව, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හා Legacy පද්ධති වල අය කරගත හැකි හිඟ බදු හා දඩ ශේෂ ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 264.4 සිට රු. බිලියන 267.4 දක්වා රු. බිලියන 3 කින් වැඩි වී ඇති අතර අයකිරීම් තාවකාලිකව අත්හිටවූ හිඟ බදු හා දඩ ශේෂ ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 314.8 සිට රු. බිලියන 430.2 දක්වා රු. බිලියන 115.3කින් වැඩි වී තිබුණි. ඒ අනුව මුළු හිඟ ආදායම වැඩි වීම රු. බිලියන 118.4ක් වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වයේ බලපෑම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු අඩාල වීමත්, බදු ගෙවන්නන් සඳහා ලබා දුන් සහනදායී ක්‍රියාපටිපාටීන් හේතු වූ බව. | අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ බදු පනත්වල දැක්වෙන ක්‍රියාමාර්ග සියලුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අය කිරීමට/ නිරවුල් කිරීමට පියවර ගැනීම ගත යුතු බව. |
| **(ii)** Legacy පද්ධතියේ මුළු හිඟ බදු හා දඩ ආදායම රු. බිලියන 291.2ක් විය. ඒ අතරින් රු. බිලියන 190.8ක මුදලක් විවිධ හේතු මත අත්හිටුවා තිබුණ අතර අය කරගත හැකි බදු හා දඩ මුදල රු. බිලියන 100.4ක් අය කර ගැනිමට පියවර ගෙන නොතිබුණි. | Legacy හා RAMIS පද්ධතිවල අයකර ගත හැකි බදු හා දඩ මුදල් සත්‍ය වශයෙන්ම අයකර ගත හැකි ප්‍රමාණය නොවන බවත් ඒ සඳහා විවිධ ගැලපීම් සිදු කළ යුතු බවත් හා අය කළ හැකි හිඟ බදු අයකර ගැනීමට පියවර ගන්නා බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| **(iii)** | RAMIS පද්ධතියේ මුළු හිඟ බදු හා දඩ ආදායම රු. බිලියන 406.4ක් විය. ඒ අතරින් රු. බිලියන 239.4ක මුදලක් විවිධ හේතු මත අත්හිටුවා තිබුණ අතර අය කරගත හැකි බදු හා දඩ මුදල රු. බිලියන 167ක් අය කර ගැනිමට පියවර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| **(iv)** | 2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරින ලද බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනට පැවැති හිඟ බදු හා දඩ ශේෂ නිරවුල් කිරීම සඳහා නියෝජ්‍ය ජනරාල්වරයෙකු යටතේ වෙනම අංශයක් ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් කර නොමැති රු. බිලියන 31.5ක හිඟ බදු හා දඩ ශේෂයක් එම අංශයේ පැවැති බව නිරීක්ෂණය විය. | හිඟ ශේෂ නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | පැහැර හරින ලද බදු අය කර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ විධිවිධාන ක්‍රියාත්මක කර පැහැර හරින ලද බදු අය කිරීමට හෝ නිරවුල් කිරීමට පියවර ගතයුතු බව. |

(ආ) 2020 ජුනි 30 දිනට ඉදිරිපත් කළ හිඟ බදු ආදායම් වාර්තා සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂනය විය.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ---------------------- | | -------------------------- | ------------ |
| (i) | Legacy පද්ධතිය තුල නිසි කලට වෙළුම් නිකුත් නොකිරීම හේතුවෙන් නියැදි පරීක්ෂාවට ලක් කල ආයතන 02කට අදාළ අයකලහැකි හිඟබදු වටිනාකම 2020 ජුනි 30 දින වාර්තාව අනුව රු.327,646,996කින් අධිතක්සේරු වී ඇති බව. | නිරීක්ෂණ පිළිගෙන ඇත. | කාලීනව වෙළුම් (Versions) නිකුත් කලයුතු බව. |
| **(ii)** | Legacy පද්ධතියට අදාල බදු හා දඩ සංශෝධන කිරීම සඳහා ජර්නල් සටහන් පිළියෙළ කර තිබුනද ඒවා පද්ධතිය තුල යාවත්කාලීන කිරීමේ ප්‍රමාදය හේතුවෙන් නියදි පරීක්ෂාවට ලක් වූ ආයතන 02කට අදාල දඩ හා බදු සංශෝධන රු. 360,127,027ක් සඳහා ජර්නල් පිළියෙළ කර යාවත්කාලීන නොවී විගණිත දින වූ 2020 අප්‍රේල් 06 දිනට මාස 06 සිට මාස 02 දක්වා ප්‍රමාදයක් පැවතුණි. | -එම- | කාලීනව ජර්නල් සටහන් යාවත්කාලීන කලයුතු බව. |
| **(iii)** | RAMIS පද්ධතියට අදාලව අය කල හැකි හිඟ බදු පරීක්ෂා කිරීමේදි නියැදි පරීක්ෂාවට ලක් කළ බදු ගෙවන්නන්ගෙන් 13දෙනෙකුට අදාළව නිකුත් කළ තක්සේරු වටිනාකම රු 5,822,238,326ක් වු අතර තක්සේරු වාර්තා නිකුත් කර වර්ෂ 01 සිට 02 ක කාල පරිච්ඡේදයක් ඉක්මවා ගොස් තිබුන ද හිඟ බදු හා දඩ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පනත් ප්‍රකාරව හිඟ බදු ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කල යුතු බව. |

**2.2 වියදම් කළමනාකරණය**

**--------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අතිරේඛ ප්‍රතිපාදන ලබා ගැනීමෙන් හා මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම් මඟින් වැය විෂයන් 08ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනය සියයට 12 සිට සියයට 105 දක්වා වූ පරාසයකින් වෙනස් කර තිබූ බව නිරීක්ෂනය විය. | ප්‍රතිපාදන වෙනස් කර ගැනීමට සිදු වූ හේතුව අනාවරණය කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට පියවර ගත යුතු බව. |
| (ආ) | මුලධන වැය විෂයන් 2ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුවෙන් වෙන් කර දී තිබූ එකතුව රු.22,500,000ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිඳු මුදලක් උපයෝජනය කර නොතිබුණි. තවද, මුලධන වැය විෂයන් 10ක් හා පුනරාවර්තන වැය විෂයන් 02ක් සඳහා ලබා දී තිබූ එකතුව රු.2,258,925,000ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,484,732,042ක් පමණක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරිවීම් රු.774,192,958ක් වූ අතර එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 65ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය. | ප්‍රතිපාදන ඌන උපයෝජනයට හේතුව රට තුළ පැවති වසංගත තත්ත්වය බව. | ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි සකසා ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කළ යුතු බව. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිලිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිය ගිය නිලධාරීයෙකුට අදාළ රු. 191,514ක ණය ශේෂයක් හිඟ හිට ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් වී නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගන්නා බව. | ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | නිලධාරින් විශ්‍රාම ගොස් මාස 3-12 හා වසර 2-3 අතර කාලසීමාවක් යන තුරුත් නිරවුල් නොවූ නිලධාරීන් 10 දෙනෙකුගේ එකතුව රු. 1,341,802ක් වූ ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් වී නොතිබුණි. | ඉතිරිව ඇති ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | -එම- |
| (ඇ) | 2018 වර්ෂයට පෙර වැඩ තහනම් කරන ලද නිලධාරීන් තිදෙනෙකු ගෙන් අය විය යුතු එකතුව රු. 350,348ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් කරවා ගෙන නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට අධිකරණ කටයුතු කරමින් පවතින බව. | -එම- |
| (ඈ) | තනතුර හැර ගිය නිලධාරීන් 5 දෙනෙකුට අදාළ එකතුව රු. 563,616ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් වී නොතිබුණි. | නිතීමය ක්‍රියා මාර්ග ගැනිමටත් වාරික වශයෙන් අය කිරීමටත්, නිලධාරීන් දැනුවත් කිරීමටත් කටයුතු කර ඇති බව. | -එම- |

**2.4** **බැදීම් හා බැරකම්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රතිපාදන නොමැතිව සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන් 02 ක් සඳහා රු.3,516,194ක බැදීම් හා බැරකම්වලට ඇතුළත් වී තිබුණි. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී නොමැති බව. | වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිදු වියදමකට හෝ බැදීමකට නොඑළඹිය යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකළ වර්ෂයට අදාල බැරකම්වල වටිනාකම රු.7,037,467ක් විය. | 2021 ජනවාරි 31 දිනෙන් පසුව ගෙවන ලද මෙම ගෙවීම් බැරකම් ලෙස ගිණුමට ඇතුළත් නොකරන ලද බව. | බැරකම් වලට එළඹීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කලයුතු බව. |

**2.5** **ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතික වීම්**

------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුල සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, 2021 වර්ෂයට අදාළ 2021 ජුනි 17 දින තෙක් නිකුත් කරනු ලැබූ විගණන විමසුම් 06ක් සඳහා 2021 අගෝස්තු 05 වන දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා පිළිතුරු සැපයීමට අපහසු වූ බවත් විගණන විමසුම් සඳහා අතුරු පිළිතුරු ලබා දී ඇති බවත් දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයට සුවිශේෂී වූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ අතර එම සැලැස්ම පදනම් කර ගෙන ආයතනයට සුදුසු ලෙස සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම කාර්යසාධන ගිවිසුමක් ද සකස් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.7** තැන්පතු

-----------

**පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------------------- | | ------------------------- | ----------- |
| (අ) | ඉකුත් තැන්පතු ලෙස පොදු තැන්පත් ගිණුම් 03ක පවතින වසර 02 ක් ඉක්මවූ එකතුව රු.538,195ක් වූ තැන්පත් ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි | ඉකුත් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාරසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | රු. 2,177,821,740ක මුද්දර බදු ආදායම්, පළාත් සභා වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව විගණන දිනය දක්වා අංක 6000-0-0-014-0-03 දරන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අක්මුදල් ලැබීමෙන් පසුව පළාත් සභා වෙත ප්‍රේෂණය කරනු ඇති බව. | රැස්කළ මුද්දර බදු ආදායම පළාත් සභා වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු බව. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------------------- | | ------------------------- | ------------------------- |
| (අ) | බදු පරිපාලනය සඳහා ආදායම් කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම සඳහා පනත යටතේ වන කටයුතු 04ක් ඉටු කිරීමට RAMIS 2.0 හි අදියර B යටතේ සිංගප්පූරු ඩොලර් 15,534, 364ක් සහිතව 2020 ජුලි 01 ආරම්භ වීමට ගිවිසුම් ගත වී තිබූ නමුත් එම කටයුතු විගණිත දින වන විටත් නිම වී නොතිබුණි. එහිදී 2018/19 හා 2019/20 තක්සේරු වර්ෂ වල බදු වාර්තා භාරගැනීමට කටයුතු කර තිබුණද, එම බදු වාර්තා සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාවලිය සැලසුම්කළ පරිදි පද්ධතිය තුල සිදු වී නොතිබුණි. | දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර වූ කරුණු හේතුවෙන් 2020 වර්ෂය තුළ දී නිම කිරීමට නොහැකි වූ බව. | පනත් ප්‍රකාරව ඉදිරි ක්‍රියාවලිය සිදු කිරීම සඳහා RAMIS පද්ධතිය කඩිනමින් සංවර්ධනය කර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | RAMIS 1.0 පද්ධතිය 2016 වර්ෂයේදී ආරම්භ වී 2020 ඔක්තෝබර් මාසයේදී දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට යෝජිත ව තිබුණු අතර එදින දක්වා නඩත්තු හා සේවා ගාස්තු ලෙස රු. මිලියන 725ක් ගෙවා තිබුණි. පවරා ගැනීම සඳහා පූර්ව කටයුතු කාලීනව සිදු වී නොතිබීම හා යෝජිත නව්‍යතා හේතුවෙන් 2021 ජනවාරි 31 දින දක්වා දීර්ඝ කරනු ලැබූ නඩත්තු කිරීමේ සේවා ගිවිසුම නැවතත් වසර 03 කට දීර්ඝ කිරීමට කටයුතු කර ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පාලනයෙන් බාහිර කරුණු සහ අනපේක්ෂිත කරුණු නිසා සැලසුම් කළ පරිදි RAMIS හි නඩත්තු කටයුතු පවරා ගැනීමට නොහැකි වී ඇති බව. | RAMIS පද්ධතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම ගිවිසුම් ප්‍රකාරව කාලීනව සිදුවිය යුතු බව. |

**3. 2 පාඩු හා හානි**

----------------

**පහත කරුණු නිරීක්ෂණය කෙරේ.**

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මත්පැන් බලපත්‍ර සහ බෝතල් රා විකිණීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බලපත්‍ර මත අයකළයුතු හිඟ මුද්දර ගාස්තු පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 07ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 74 ක් පදනම් කර සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී 2008-2020 කාලපරිච්ඡේදයට අදාලව නිකුත් කරන ලද බලපත්‍ර මත අයකළයුතු හිඟ මුද්දර ගාස්තු, රු. 174,701,500ක් 2020 මැයි 31 දින වන විටත් අයකර ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගෙන ඇත. | සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | මත්පැන් අලෙවි ව්‍යාපාරයන් වෙත වර්ෂයක කාලපරිච්ඡේදයක් තුළ අවස්ථා කීපයකදී, එකම ව්‍යාපාරිකයාට / එකම වෙළඳාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් එවැනි බලපත්‍ර 362 ක් නිකුත්කර තිබුණද, එම බලපත්‍ර සඳහා අය විය යුතු මුද්දර ගාස්තුවෙන් රු. 6,482,000ක් අයකර නොතිබුණු බවයි. | නිරීක්ෂණය පිළිගෙන ඇත. | නිවැරදි බදු මුදල අය කිරීමට කඩිනම් පියවර ගත යුතු බව හා මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා විධිමත් පියවර ගත යුතු බව. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11ක් විසින් මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමේදී රු. 4,209,511ක මුද්දර ගාස්තු අඩුවෙන් අයකර තිබුණි | -එම- | -එම- |

**3.3 කළමනාකරණ දුර්වලතා**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ---------------------- | | | ---------------------- | ------------ |
| (අ) | (i) | 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද ආදායම් ඇස්තමේන්තුව රු.බිලියන 613ක් වූ අතර එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රැස් කර ගත නොහැකි බවත් රැස් කර ගත හැකි ආදායම රු.බිලියන 431ක් ලෙස දක්වමින් ආදායම් ඇස්තමේන්තු සංශෝධනයක් ඉදිරිපත් කර තිබුණි. මෙම අගයන් දෙක අතර වෙනස රු.බිලියන 182ක් වූ අතර එය සියයට 30 ක ප්‍රතිශතයක විචලතාවයකින් යුක්ත විය. | පිළිතුරු ලබා දී නොමැත. | ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමු කල යුතු වීම, මුදල් අමාත්‍යංශය හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මනා සබඳතාවයකින් ඒ පිළිබඳව කටයුතු කළ යුතු වීම හා රජය විසින් දෙනු ලබන බදු සහන පිලිබඳ තක්සේරුවක් සිදු කිරීම තුලින් එහි බලපෑම විශ්ලේෂණය මඟින් ආදායමට සිදු කරනු ලබන වක්‍ර හා සෘජු බලපෑම් කෙරෙහි අවධානයෙන් කටයුතු කළ යුතු වීම. |
| | (ii) | ආර්ථික පුනර්ජීවන වැඩ සටහන හා COVID – 19 වසංගත තත්ත්වයේ බලපෑමෙහි හේතුන් ද ඇතුළත්ව පෙර වර්ෂය හා සැසඳීමේ ඇස්තමේන්තු ගත ආදායම රු බිලියන 627කින් හා සත්‍ය ආදායම රු බිලියන 464කින් පහල යාමක් පෙන්නුම් කළ අතර එය පිලිවෙලින් සියයට 60 ක හා සියයට 47.62ක ප්‍රතිශතයකින් යුක්ත විය. රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විවිධ බදු සංශෝධනයන් පිළිබඳව ගණනය කිරීමකින් හා පදනමකින් තොරව ඇස්තමේන්තු සකස් කරනු ලැබීමත්, හදිසි අවස්ථාවන් හි දී රජය මඟින් ලබා දෙන සහන තක්සේරු කොට කඩිනමින් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවක් ලබා දීමට සක්‍රීය දායකත්වයක් නොදැක්වීමත්, හේතුවෙන් රජයේ ආර්ථික ප්‍රතිපත්තින්ගෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 ජුනි 30 දිනට දෙපාර්තමේන්තුව විසින් හිඟ බදු අය කර ගැනීම සඳහා පවරා ඇති නඩු සංඛ්‍යාව 1739ක් වූ අතර, අය කර ගත යුතුව පැවති හිඟ මුදල රු. 2,587,290,912ක් විය. එම නඩු අතරින් හිඟ බදු රු. 2,050,972,192කට අදාළ නඩු 793ක් බහා තබා තිබූ ඒවා විය. | ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිග බදු අයකර ගැනීම සඳහා පවරා ඇති නඩු ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කඩිනම් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු බව. |
| (ඇ) | 2011/12 තක්සේරු වර්ෂයේ සිට 2014/2015 තක්සේරු වර්ෂය දක්වා Legacy පද්ධතියේ පැවති බදු ගෙවන්නන් 552කුට අදාලව එකතුව රු. 3,963,865,684ක් වූ බදු ආපසු ඉල්ලීම් පැවති අතර එම බදු ගෙවන්නන් සඳහාම රු. 58,510,467,150ක හිඟ බදු හා දඩ ශේෂයන් පැවතිණි. | තොරතුරු පරීක්ෂා කර පිළිතුරක් ලබා දිය හැකි බව. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු බව. |
| (ඈ) | 2020 ජුනි 30 දිනට Legacy පද්ධතියට අදාල ආදායම් බදු , ආර්ථික සේවා ගාස්තු හා එකතු කල අගය මත බදු යන බදු වාර්තාව මත හිඟ බදු ශේෂ (Version -0) රු. 1000 ට වඩා වැඩි ප්‍රමාණයේ එකතුව රු. 31,065,548,562ක් වූ අතර එම හිඟ බදු නිරවුල් කිරීමට 2020 ජුනි 30 දින වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | හිඟ හිටි කාලඡේදයට පෙර කාලඡේදයන්ට අදාළ අතිරික්ත බදු බැර කාලීනව හිලව් නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබෙන බව. | පනතේ වගන්තිය ප්‍රකාර කටයුතු කල යුතු බව. |
| (ඉ) | ආයතනයක් විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට එකතුකළ අගය මත බදු මුදලට අදාලව පිළිවෙලින් රු. 837,509,421ක හා රු. 558,997,052ක ලැබිය යුතු හා ගෙවිය යුතු බදු ශේෂ වූ අතර Legacy හා RAMIS පද්ධති අනුව විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව බදු ආපසු ගෙවීම් පිළිවෙලින් රු. 91,653,439ක් හා රු. 7,757,555ක් විය. හිඟ බදු හා දඩ මුදල් පිළිවෙලින් රු. 24,286,833ක් හා රු. 429,987ක් විය. RAMIS පද්ධතියේ VAT සම්බන්ධව නිම නොවූ වැඩ අයිතම 15 ක් පැවතිම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට බදුකරුගෙන් ලැබිය යුතු හිඟ බදු ශේෂය හා බදු ආපසු ගෙවීම් පිළිබඳ නිවැරදි තොරතුරු පද්ධතිය ඇසුරින් විගණනයට ලබා ගැනීමේ හැකියාව නොතිබූ අතර ලිපිගොනුව පරිපාලනය කරනු ලබන අංශය විසින් ඒ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු විගණනය ලබා දී නොතිබුණි. | සම්පූර්ණ පිළිතුරක් ලබා දී නොතිබුණි. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු අතර ලිපිගොනුව පරිපාලනය කරන අංශය විසින් නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සංස්ථාවක් විසින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බදු ශේෂ පිළිබඳ පරීක්ෂාවේදී RAMIS පද්ධතියට අනුව දෙපාර්තමේන්තුව විසින් ආපසු ගෙවිය යුතු බවට මෙතෙක් තීරණය වූ බදු කිසිවක් පෙන්නුම් නොකෙරුණි. තවද ලැබිය යුතු හිඟ බදු හා දඩ ශේෂය රු. 13,834,414,718ක් ද legacy පද්ධතියට අනුව 2020 ජුනි 30 දිනට ශේෂය රු. 1,043,364,943ක් ද, DTRU අංශයට අනුව 2020 සැප්තැම්බර් 21 දිනට රු. 3,502,832,668ක් ද වශයෙන් මුළු හිඟ බදු හා දඩ ශේෂය රු.18,398,612,329ක් විය. තවද RAMIS පද්ධතියේ වැඩ අයිතම පිළිබඳ පරීක්ෂාවේදී සංස්ථාවේ බදු කටයුතු වලට අනුයුක්ත නිලධාරියා වෙත යොමුවී ඇති නිම නොවූ වැඩ අයිතම 34ක් පැවති බව නිරීක්ෂණය විය. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කලයුතු අතර නිලධාරියා වෙත යොමු වී ඇති වැඩ අයිතම නියමිත පරිදි නිම කල යුතු බව. |
| (උ) | සේවා යෝජකයින් විසින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිශ්‍රමික ගෙවීමේ දී සේවා නියුක්ති ආදායම මත බදු අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය. එසේ එවා ඇති වාර්තා අතරින් දෙපාර්තමේන්තුවක් හා රාජ්‍ය සමාගමකට අදාළ 2018/2019 තක්සේරු වර්ෂයේ උපයන විට ගෙවීමේ බදු වාර්තා හා උප ලේඛන පරිගණක පද්ධතිය ඇසුරින් පරික්ෂා කරන ලදි. උපලේඛන වල දැක්වෙන පාරිශ්‍රමික පදනම් කර ගෙන දේශීය ආදායම් පනතේ බදු අනුපාත අනුව ආදායම් බද්ද ගණනය කිරීමේ දී යථෝක්ත ආයතන 2 විසින් නිලධාරීන් 621 දෙනෙකුගේ එකතුව රු. 6,592,513ක මුදලක් උපයන විට ගෙවීමේ බදු ලෙස අඩුවෙන් අය කර එවා තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කරන බව. | අදාළ බදු අනුපාතයන්ට අනුකූලව උපයන විට ගෙවීම් බදු ගණනය කර අයකල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2020 අගෝස්තු මාසය අවසන් වන විට දේශීය ආදායම් දෙපාර්තුමේන්තු නිලධාරීන් වෙත RAMIS පද්ධතිය මගින් වර්ෂ 2015 සිට 2019 වර්ෂය දක්වා විගණනය සඳහා යොමු කර තිබූ බදු ලිපිගොනු සංඛ්‍යාව 46,388ක් විය. නමුත් වැඩ අවසන්වී තිබුනේ බදු ලිපිගොණු 27,747ක පමණි. තවද WI_Audit_Perform_Risk Assessment යටතේ බදු වාර්තා 64,193ක් යොමු කර තිබුනද ඒ සියල්ල නිම නොවූ වැඩ අයිතම ලෙස පැවතුනි. | මෙම වැඩ අයිතම අවසන් කිරීමට උපදෙස් ලබා දීමට අදාළ ජ්‍යේෂ්ඨ කොමසාරිස් වරුන් වෙත දැනුම් දීමට කටයුතු කල බව. | අදාළ වැඩ අයිතම නිම කිරීමට අවශ්‍ය කටයුතු කලයුතු බව. |
| (එ) | දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සැලසුම් සහ නව සොයාගැනීම් අංශයේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව තනතුරු 05ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකුගේ හිඟයක් පැවතීම නිසා අංශය වෙත ලබා දී තිබූ සෞඛ්‍ය අංශයේ හා ඉදිකිරීම් සේවා අංශයේ බදු ආදායම ඉහළ නංවා ගැනීම සඳහා පර්යේෂණාත්මක තොරතුරු සම්මතයන් හා නිර්ණායක සකස් කිරීමේ කාර්යය ඉටු වී නොතිබුණි. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බව හා ඉලක්ක ගත කාර්යයන් සංශෝධනය කර ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති පරිදි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගතයුතු අතර මූලික ඉලක්ක ගත කාර්යයන් ඉටු කලයුතු බව. |
| (ඒ) | 2020 සැප්තැම්බර් 20 දිනට RAMIS පද්ධතිය තුළ යාවත්කාලීන කර තිබූ 2018 වර්ෂයේ අභියාචනා ලේඛනයේ ඇතුළත් කාල කඩඉමට යටත් වී ඇති අභියාචනා සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂාවේ දී පහත කරුනු නිරීක්ෂණය විය.<br><br>(i) අභියාචනය ලැබී වසර 2 ඉක්මවූ විසඳමින් පවතින තත්ත්වයේ (Accepted) පවත්නා අභියාචනා 61හි මතභේදාත්මක බදු හා දඩ මුදලේ එකතුව රු. 577,189,148ක් විය. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත යොමු කරන ලද එකතුව රු. 15,280,049,777ක් මතභේදකාරී බදු හා දඩ මුදලක් ඇතුළත් අභියාචනා 79ක් ද විය.<br>(ii) බදු අභියාචනා හා බදු ගෙවන්නන් විසින් සිදු කරනු ලබන විමසීම් ලෙස වෙන්කර හඳුනා නොගත් ඉදිරි කටයුතු කළ බව තහවුරු නොවූ බදු ගෙවන්නන්ගේ යොමුකිරීම් 474ක් පැවති අතර ඒවායේ ඇතුළත් බදු හා දඩ මුදල් පිළිවෙලින් රු.1,316,489,719ක් හා රු. 269,899,192ක් විය. එම යොමු කිරීම් තුළ බදු අභියාචනා ද ඇතුළත් විය හැකි බව නිරීක්ෂණය විය. | අභියාචනා වලින් කොටසක් හඳුනාගෙන හා විසඳා අවසන් කර ඇති අතර කොටසක් තව දුරටත් නිම කිරීමට ඇති බව. | 2006 අංක 19 දරණ දේශීය ආදායම් පනතේ 165 (14)අ වගන්තිය ප්‍රකාරව කටයුතු කලයුතු බව. |

**4.** **තිරසාර සංවර්ධනය**

**පහත කරුණු නිරීක්ෂණය කෙරේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසාර සංවර්ධන උපාය මාර්ග සකස් කර ගෙන නොතිබුණ අතර එයට අදාළ ක්‍රියාකාරකම් 2020 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් කර නොතිබුණි. | මේ වන විට කටයුතු කෙරෙමින් පවතින බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**පහත කරුණු නිරීක්ෂණය කෙරේ.**

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **අනුයුක්ත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය**<br>පහත කරුණු නිරීක්ෂණ කෙරේ. | | | |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 320 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 11 ක් විය. | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 320 ක් පවතින බව. | අත්‍යාවශය තනතුරු සඳහා වන කාර්යය මණ්ඩල පුරප්පාඩු අනුමත පරිදි පිරවීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 206 ක් පුරප්පාඩු වී පැවති අතර එයට නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුරු 07ක් ද ජ්‍යෙෂ්ඨ කොමසාරිස් තනතුරු 12ක් ද කොමසාරිස් තනතුරු 52 ක් ඇතුළත්ව තිබුණි. මෙම පුරප්පාඩුව පවතින තනතුරු 71 වැඩ බැලීම මගින් ආවරණය කෙරෙන අතර එය අනුමත තනතුරු වලින් සියයට 59 බවත් නිරීක්ෂණය විය. මෙම තත්ත්වය නව ආදායම් බදු පරිපාලන පරිගණක පද්ධතියේ කටයුතු කාර්යක්ෂමව හා ඊට අදාළ වැඩ අයිතම කාලීනව නිම කිරීම කෙරෙහි බලපෑමක් ඇති වියහැකි බව නිරීක්ෂණය විය. | අනුමැතියට යටත්ව වැඩ බැලීමේ පදනම මත කොමසාරිස්වරු අනුයුක්ත කර ඇති බව. | අත්‍යාවශය රාජකාරී සඳහා වැඩ බැලීම මගින් ආවරණය කෙරෙන තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කලයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තෘතියික මට්ටමේ පුරප්පාඩු වී ඇති තනතුරු 31න් 28ක් තොරතුරු තාක්ෂණික නිලධාරීන් වන අතර එම නිලධාරීන් මේ දක්වා බඳවා ගැනීමට කටයුතු කර නොගැනීම මත නව අදායම් බදු පරිපාලන පරිගණක පද්ධතිය (RAMIS) මෙහෙයවීම හා එහි නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම ප්‍රමාද වීමකෙරෙහි ඍජුවම බලපෑමක් ඇති කර තිබුණු බව නිරීක්ෂණය විය. | තනතුරු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව. | අත්‍යාවශය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කලයුතු බව. |